"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 2698409
ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone 2682868, 2682869, 2682870

මගේ අංකය. / எனது இல. / My No. CSO/ADM/18/38(03) -2016
ඔබේ අංකය. / உமது இல. / Your No.
දිනය. / திகதி. / Date. 2016.09. 26

පාලන චක්‍රලේඛ ලිපි

සභා ලේකම්,
ලේකම් - පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / පිරිස් හා පුහුණු / මූල්‍ය / සැලසුම් / ඉංජිනේරු),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන),
ආදායම් කොමසාරිස් (බ.ප),

ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපි ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු කරුණු.

බස්නාහිර පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වල විවිධ කටයුතු සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙතින් උපදෙස්, නියෝග හා අනුමැතීන් ලබා ගත යුතු අවස්ථාවන්හිදී ඊට අදාළ ලිපි ඉදිරිපත් කිරීමේදී පහත උපදෙස් පරිදි කටයුතු කළ යුතු බවට අවධාරණය කරමි.

02 දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම ආයතන මට්ටමින් විසඳිය යුතු ගැටළු හා ප්‍රශ්න අදාළ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශ හා නිරීක්ෂණ අනුව විසඳීමට පියවර ගත යුතු අතර එසේ විසඳීමට නොහැකි වන ගරු ආණ්ඩුකාරතුමාගේ බලතල යටතේ එතුමාගේ විශේෂ අනුමැතිය මත කටයුතු කළ යුතු අවශ්‍යතාවන් පමණක් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට වග බලා ගත යුතුය.

03 එසේ තීන්දු තීරණ ගැනීමට නොහැකිවන කරුණු පමණක් නිවැරදිව නිශ්චය කර ආයතන සංග්‍රහයේ XXV11 වන පරිච්ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානී/අමාත්‍යාංශ ලේකම්/ප්‍රධාන ලේකම් මඟින් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කළ යුතු අතර එසේ ඉදිරිපත් කිරීමේදී අදාළ විෂයයට සම්බන්ධ ආයතන ප්‍රධානී ඇතුළුව අදාළ බලධාරීන් විසින් පැහැදිළි නිර්දේශ හා නිරීක්ෂණ සමඟ මාගේ නිර්දේශ සඳහා ඉදිරිපත් කළ යුතුය. එම නිරීක්ෂණ හා නිර්දේශ සලකා බලා මාගේ නිර්දේශයද සහිතව ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ.

04 එසේ වුවත් ප්‍රධාන ලේකම්ගේ අංක: 1/10/4/6 හා 2005.03.28 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති බස්නාහිර පළාතේ සියලුම සේවකයින් හා නිළධාරීන්ගේ පෞද්ගලික විදේශ නිවාඩු ඉල්ලුම් කිරීමේදී අමාත්‍යාංශ ලේකම් විසින් සෘජුව ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට ලබා දී තිබූ නියෝගය තව දුරටත් නොවෙනස්ව ඉදිරියට බලපැවැත්වෙනු ඇත.

එම්.ඒ.බී.දයා සෙනරත්,
ප්‍රධාන ලේකම් (රා.ආ),
බස්නාහිර පළාත.

පිටපත

ආණ්ඩුකාර ලේකම් (බ.ප) - දැ.ග.ස